# ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව බාරේ,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7.

2016-02-18

ගරු ස්වාමීන් වහන්ස/ මහත්මයානනි/ මහත්මියනි/ මෙනෙවියනි,

## 50 වන වාර්ෂික මහා සභා රැස්වීම හා විශේෂ දේශනය

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 50වන වාර්ෂික මහා සභා රැස්වීම **2016 මාර්තු මස 13 වන දින (ඉරිදා) ප.ව. 2.00** ට කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි මහවැලි කේන්ද්‍රයේ පළමු මහලේ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිති සභා ශාලාවේදී පැවැත්වේ.

වැඩසටහන

ප.ව. 2.00 - **50 වන වාර්ෂික මහා සභා රැස්වීම**
ප.ව. 3.00 - විශේෂ දේශනය - **''පුරාවිද්‍යාවෙන් මා උගත් දෑ''**
දේශක - **මහාචාර්ය විනී විතාරණ මහතා**
**හිටපු සභාපති, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය**

2016/2017 වසර සඳහා පත්කිරීමට යෝජනා කරන නිලධාරි මණ්ඩලය හා ඉදිරිපත්ව ඇති යෝජනා පහත සඳහන් වේ. 50 වැනි වර්ෂය සඳහා වන වාර්ෂික ප්‍රගති වාර්තාවද මේ සමඟ අමුණා ඇත. වාර්ෂික මහා සභා රැස්වීමට හා දේශනයට සහභාගි වීමට පැමිණෙන මෙන් ඔබට ගෞරවයෙන් ආරාධනා කරමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

සමන් අබේසිංහ/ බෙනට් ප්‍රනාන්දු
ගරු සමලේකම්වරු

---

**<u>ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ව්‍යවස්ථාවේ 7 (ඇ) වගන්තියට අනුකූලව විධායක සභාව මගින් 2016/2017 වසර සඳහා නිලධාරි මණ්ඩලයට යෝජනා කරනු ලබන නාමයෝජනා</u>**

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | ආචාර්ය මහින්ද පී. මලලසේකර |
| ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති | : | රංජිත් හේවගේ |
| ගරු උපසභාපති | : | ආචාර්ය කාවන් රත්නතුංග |
| ගරු සමලේකම්වරු | : | සමන් අබේසිංහ<br>බෙනට් ප්‍රනාන්දු |
| ගරු සම්බන්ධීකරණ ලේකම් | : | සංජීවනී විද්‍යාරත්න |
| ගරු භාණ්ඩාගාරික | : | ලක්ෂ්මන් රත්නායක |
| ගරු සංස්කාරක | : | ධනේෂ් විසුම්පෙරුම |
| ගරු විධායක සභිකවරු (8) | : | බන්දු වීරවර්ධන<br>හේමතිලක බණ්ඩාර<br>මුදිත කරුණාමුනි<br>සී. එච්. ඉද්දගොඩ<br>රුක්ෂිලා සංජීවනී<br>සිරිල් ආරියපාල<br>යොහාන් ෆෙරෙයිරා<br>ජීමී මාරඹේ |

මෙම නාමයෙජනා හැර අදාළ තනතුරු සඳහා සංගමයේ සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන වෙනත් නාම යෝජනා වේ නම්, යෝජනාකරු සහ ස්ථිරකරු විසින් අත්සන් කරන ලද එම නාමයෝජනා 2016-03-10 දින හෝ ඊට පෙර ගරු සමලේකම්වරුන් වෙත තැපැල් මගින් එවීමට හෝ පැමිණ භාර දීමට හැකිය. යම් තනතුරක් සඳහා නාමයෝජනා වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත්ව තිබේ නම් ඡන්ද විමසීමක් පවත්වනු ලැබේ.

**<u>විධායක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

විධායක සභාව විසින් අනුමත කළ පහත සඳහන් යෝජනා වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමත කිරීමට නියමිතය.

1. ව්‍යවස්ථාවේ 6 (ආ) iii වගන්තිය යටතේ පහත නම් සඳහන් පුද්ගලයින් සංගමයේ උප අනුශාසකවරුන් ලෙස පත් කිරීමට විධායක සභාව විසින් යෝජනා කරනු ලැබේ.
    1. මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා
    2. මහාචාර්ය පී. එල්. ප්‍රේමතිලක මහතා
    3. සිරිනිමල් ලක්දුසිංහ මහතා
2. පුරාවිද්‍යා සංගමයේ ව්‍යවස්ථාවේ 9වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරනු ලැබේ.

    පවත්නා වගන්තිය: ''9. ව්‍යවස්ථා සංශෝධනය:- ව්‍යවස්ථා සංශෝධනය වාර්ෂික රැස්වීමක දී කළ යුතුය. එවැනි සංශෝධන වලංගු වන්නේ පැමිණ සිටි සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක ඡන්ද ලදහොත් පමණය.''

    යෝජිත සංශෝධිත වගන්තිය: ''9. ව්‍යවස්ථා සංශෝධනය:- ව්‍යවස්ථා සංශෝධනය වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී කළ යුතුය. එවැනි සංශෝධන වලංගු වන්නේ පැමිණ සිටි සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක ඡන්ද ලදහොත් පමණය.''